FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

**2023 ජනවාරි**

3 වන වෙළුම - කලාප අංක 01


'කළු ජනවාරිය' සැමරුම් රැසක්


අනුරුද්ධ බණ්ඩාරගේ පෙත්සමට අවසර


වසන්ත මුදලිගේ නිදහස් කරයි

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 15ක් 2023 ජනවාරි මාසයේදී නිරීක්ෂණය විය. නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 12ක්, ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 03ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. කැලණිය සරසවි සිසු නායකයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.
2. අපහාසාත්මක ප්‍රකාශයක් සිදු කිරීමේ චෝදනාව මත සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ සේපාල් අමරසිංහ අත්අඩංගුවට ගැනීම.
3. සමාජ මාධ්‍ය නියාමනයට නව නීති පනවන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කිරීම.
4. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ රඳවා තබාගැනීමට එරෙහිව ජාත්‍යන්තර සංවිධාන 7ක් ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීම.
5. 'සමාජ මාධ්‍ය නියාමනය සහ ප්‍රකාශනයේ නිදහස' මැයෙන් විද්වත් සංවාදයක් පැවැත්වීම.
6. උද්ඝෝෂණයකට නායකත්වය දුන් සමාජ ක්‍රියාකාරිනියකට එරෙහිව, පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කිරීම.
7. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ 'කළු ජනවාරිය සැමරුම' කොළඹදී පැවැත්වීම.

8. ඝාතනයට ලක්වූ සහ අතුරුදන් වූ මාධ්‍යවේදීන් සිහිපත් කරමින්, මුලතිව් මාධ්‍යවේදීන් කළු ජනවාරිය සැමරීම.

9. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් වී වසර 13ක් පිරීම නිමිත්තෙන් සත්‍යග්‍රහයක් පැවැත්වීම.

10. මාධ්‍යයට එරෙහි අපරාධ හෙළාදකිමින් මඩකලපුවේ මාධ්‍යවේදීන් 'කළු ජනවාරිය' සැමරීම.

11. වෘත්තිය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ කළු ජනවාරි සැමරුම කොළඹදී පැවැත්වීම.

12. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දුට එරෙහිව අනුරුද්ධ බණ්ඩාර ගොනු කළ පෙත්සමට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර දීම.

13. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි වසන්ත මුදලිගේ නිදහස් කරන ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා නියෝග කිරීම.

14. පොලිසියේ ප්‍රහාරයට ලක් වූ සිරස මාධ්‍යවේදීන් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.

15. ශ්‍රී ලංකා රජය මානව හිමිකම් උල්ලංඝනය කරන බවට මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය ප්‍රකාශ කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2023 ජනවාරි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය කොන්දේසි | 12 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 03 |
| **එකතුව** | **15** |

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 12ක් ජනවාරි මාසය තුළ නිරීක්ෂණය විය. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට එරෙහි රජයේ ක්‍රියාමාර්ග අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්වීමේ අවස්ථා කිහිපයක් ඒ අතරින් කැපී පෙනෙයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි සැකකරුවකු, පළමු වරට මහේස්ත්‍රාත් අධිකරණයකින් නිදහස් වීම, පුරවැසි අයිතිවාසිකම් පුළුල් කළ සුවිශේෂ අවස්ථාවකි. 'මාධ්‍යයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් දණ්ඩමුක්තිය' නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන බැවින්, කළු ජනවාරි සැමරුම් පිළිබඳ තොරතුරුද මෙහි ඇතුළත් කර ඇත.**

**2 වගුව: 2023 ජනවාරි: නීතිමය කොන්දේසි - සිදුවීම් 12**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 06 |
| මාධ්‍යයට නීතිමය සීමා කිරීම්/නව නීති පැනවීම් | 01 |
| මාධ්‍යයට එරෙහි සිදුවීම්වලදී දණ්ඩමුක්තිය | 05 |
| **එකතුව** | **12** |

1. **කැලණිය සරසවි සිසු නායකයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට පැවැත්වූ උද්ඝෝෂණයකදී පොදු දේපළවලට අලාභ හානි සිදු කරන ලදැයි චෝදනා කරමින් කැලණිය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති කැළුම් මුදන්නායක සහ ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු වන ඩිල්ෂාන් හර්ෂණ, තලංගම පොලිසිය මගින් අත්අඩංගුවට ගන්නා ලදි. ජනවාරි 02 වැනිදා කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ජනවාරි 10 වැනිදා දක්වා

රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි. නඩුව යළි කැඳවූ අවස්ථාවේදී, ඔවුන් පෙබරවාරි 20 වැනිදා දක්වා යළි රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි.

මූලාශ්‍රය: www.lankadeepa.lk

02. **අපහාසාත්මක ප්‍රකාශයක් සිදු කිරීමේ චෝදනාව මත සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ සේපාල් අමරසිංහ අත්අඩංගුවට ගැනීම.**

බෞද්ධ ජනතාවගේ පූජනීය විශ්වාසයක් වන දළදාවහන්සේට අපහාසයක් සිදු කළේය යන චෝදනාව මත ජනවාරි 5 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහු අත්අඩංගුවට ගැනුණු අතර පසුදා කොළඹ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.

මූලාශ්‍රය: www.youtube.com

03. **සමාජ මාධ්‍ය නියාමනයට නව නීති පනවන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කිරීම.**

සමාජ මාධ්‍ය නියාමනය සඳහා සිංගප්පූරුවේ මේ වන විට භාවිතා කරන විදුලි සංදේශ හා සමාජ මාධ්‍ය පනතට සමාන ආකාරයේ පනතක් මෙරටටද හඳුන්වා දෙන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කර තිබේ. එම ප්‍රකාශය කර ඇත්තේ, පුවත්පත් කර්තෘවරුන් සහ විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්ති අධ්‍යක්ෂකවරුන් සමඟ ජනවාරි 06 වැනිදා ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පැවැති සාකච්ඡාවකදීය.

මූලාශ්‍රය: http://www.adaderana.lk

04. **උද්ඝෝෂණයකට නායකත්වය දුන් සමාජ ක්‍රියාකාරිනියකට එරෙහිව, පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කිරීම.**

අතුරුදහන් වූවන්ට යුක්තිය ඉටු කරන ලෙස ඉල්ලා ජනවාරි 30 වැනිදා තිරුක්කෝවිල් හි පැවති විරෝධතාවකට නායකත්වය දුන් අම්පාර දිස්ත්‍රික් අතුරුදහන්වූවන්ගේ ඥාතීන්ගේ සංවිධානයේ සභාපති තම්බිරාසා සෙල්වරාණිට ජනවාරි 31 වැනිදා පොතුවිල් මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටින ලෙස සිතාසි නිකුත් කර තිබේ.

මූලාශ්‍රය: twitter.com

05. **නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ 'කළු ජනවාරිය සැමරුම' කොළඹදී පැවැත්වීම**

මාධ්‍ය වෘත්තිකයන් සුරැකීමට, 'එක්ව ඉදිරියට යාම' යන තේමාව යටතේ මෙම සැමරුම ජනවාරි මස 24 වැනිදා බොරැල්ල, නාමෙල් මාලිනී පුංචි තියටර්හිදී පැවැත්විණි. වැඩසටහනේ ප්‍රධාන ආරාධිත දේශනය නීතිඥ සංගමයේ සභාපති, ජනාධිපති නීතිඥ සාලිය පීරිස් විසින් පවත්වන ලද අතර සාකච්ඡා සභාව සඳහා මාධ්‍යවේදිනී හනා ඊබ්‍රහීම් සහ නීතිඥ උපුල් කුමරප්පෙරුම සහභාගි විය.

පසුගිය වකවානුව තුළ ඝාතනයට හා අතුරුදන්වීමට ලක් වූ මාධ්‍යවේදීන් සිහිපත් කර පහන් දැල්වීමක්ද සිදු කෙරිණි.

මූලාශ්‍රය: MFRM Desk

06. **ඝාතනයට ලක්වූ සහ අතුරුදන් වූ මාධ්‍යවේදීන් සිහිපත් කරමින්, මුලතිව් මාධ්‍යවේදීන් කළු ජනවාරිය සැමරීම**

ශ්‍රී ලංකාවේ මාධ්‍යවේදීන්ට එරෙහිව සිදුකළ අපරාධ පිළිබඳව අවධාරණය කරමින් මුලතිව් මාධ්‍ය සමාජය සංවිධානය කළ 'කළු ජනවාරිය' සැමරුම ජනවාරි 24 වැනිදා මුලතිව්හිදී පැවැත්විණි. ඝාතනය කළ මාධ්‍යවේදීන් වන සුබ්‍රමනියම් සුගීර්දරාජන්, ලසන්ත වික්‍රමතුංග හා ප්‍රගීත් එක්නැලිගොඩගේ සේයාරූවලට පුෂ්පෝහාර දැක්වීමක් හා පත්‍රිකා බෙදාහැරීමක් ඊට ඇතුළත් විය.

මූලාශ්‍රය: twitter.com

07. **මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ අතුරුදන් වී වසර 13ක් පිරීම නිමිත්තෙන් සත්‍යග්‍රහයක් පැවැත්වීම.**

අතුරුදන් කළ මාධ්‍යවේදියාගේ බිරිඳ වන මානව හිමිකම් ක්‍රියාකාරිනී සන්ධ්‍යා එක්නැළිගොඩ විසින්, ජනවාරි 24 වැනිදා මෝදර මහා කාලි අම්මාන් කෝවිලේදී මෙම සත්‍යක්‍රියාව පවත්වන ලදි. ප්‍රගීත් අතුරුදන් කිරීමට එරෙහිව යුක්තිය ඉටු කිරීමට රජය අපොහොසත් වීමට විරෝධයක් ලෙස ඇය හිස මුඩු කොට, කළු පැහැ වස්ත්‍ර හැඳ දෙවියන්ගෙන් යුක්තිය ඉල්ලා සිටීමේ පිළිවෙතකට කැප වී සිටී.

මූලාශ්‍රය: MFRM Desk

08. **මාධ්‍යයට එරෙහි අපරාධ හෙළාදකිමින් මඩකලපුවේ මාධ්‍යවේදීන් 'කළු ජනවාරිය' සැමරීම.**

මඩකළපුව දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ සාමාජිකයින් සහ ප්‍රදේශයේ සිවිල් සමාජ ක්‍රියාකාරීන් එක්ව, ජනවාරි 27 වැනිදා මඩකලපුවේදී මෙම සමරුව පවත්වන ලදි. ශ්‍රී ලංකා රජය විසින් පසුගිය දශක කිහිපය තුළ මාධ්‍යවේදීන්ට එරෙහිව කරන ලද අපරාධ හෙළා දැකීම හා දණ්ඩමුක්තියට එරෙහි වීම සඳහා මෙම සැමරුම වාර්ෂිකව පැවැත්වේ.

මූලාශ්‍රය: twitter.com

09. **වෘත්තිය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ කළු ජනවාරි සැමරුම කොළඹදී පැවැත්වීම.**

ඉකුත් වකවානුව තුළ සිදු වූ මාධ්‍යවේදීන්ට හා මාධ්‍ය ආයතනවලට එරෙහි අපරාධ සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරන ලෙස බල කිරීම හා ඝාතනයට ලක් වූ සහ අතුරුදන් වූ මාධ්‍යවේදීන් අනුස්මරණය කිරීමේ අරමුණින් මෙම සැමරුම ජනවාරි 27 වැනිදා විහාරමහාදේවී උද්‍යානය ඉදිරිපිටදී සිදු කෙරිණි.

මූලාශ්‍රය: MFRM Desk

10. **ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දුට එරෙහිව අනුරුද්ධ බණ්ඩාර ගොනු කළ පෙත්සමට ශ්‍රේෂ්ඨාධිකරණය අවසර දීම.**

2022 අප්‍රේල් මස 01 වැනිදා සාධාරණ හේතුවකින් තොරව තමන් අත්අඩංගුවට ගැනීමෙන් නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ නීතිය ඉදිරියේ සමානාත්මතාවයේ අයිතිය උල්ලංඝනය කිරීම යන කරුණු සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු වන අනුරුද්ධ බණ්ඩාර විසින් මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනු කර තිබේ. බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, මෝදර පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති ඇතුළු පොලිස් නිලධාරීන් එකොළොස් දෙනෙකු මෙහි වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇත. අනුරුද්ධ බණ්ඩාර වෙනුවෙන් ජනාධිපති නීතිඥ සාලිය පීරිස් ඇතුළු නීතිඥ කණ්ඩායමක් පෙනී සිටියි.

තිසර අනුරුද්ධ බණ්ඩාර හිටපු ජනාධිපති ගෝඨාභයට එරෙහි අප්‍රේල් 03 විරෝධතාවෙහි ක්‍රියාකාරිකයකු වන අතර GoHomeGota2022 ෆේස්බුක් කණ්ඩායමේ ඇඩ්මින්වරයකු ලෙසද ක්‍රියා කළේය.

මූලාශ්‍රය: headlinenews.lk

11. **පොලිසියේ ප්‍රහාරයට ලක් වූ සිරස මාධ්‍යවේදීන් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

පසුගිය වසරේ ජූලි 09 වැනිදා අගමැතිවරයාගේ නිවස අසල උද්ඝෝෂණයක් වාර්තා කරමින් සිටි සිරස රූපවාහිනියේ මාධ්‍යවේදීන්ට එල්ල කළ ප්‍රහාරය සම්බන්ධයෙන් එම මාධ්‍යවේදීන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ජනවාරි 31 වැනිදා සලකා බැලිණි. ප්‍රහාරයට ලක් වූ මාධ්‍යවේදීන් 8 දෙනෙකු විසින් ඉදිරිපත් කර ඇති මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස පොලිස්පතිවරයා ඇතුළු උසස් පොලිස් නිලධාරීන් සිව් දෙනෙකු නම් කර තිබේ.

භුවනෙක අලුවිහාරේ, එස්. තුරෙයිරාජා, මහින්ද සමයවර්ධන යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල හමුවේ පෙත්සම සලකා බැලේ. මෙම පෙත්සම් ජූලි 26 වැනිදා යළි කැඳවීමට නියමිතය.

මූලාශ්‍රය: www.youtube.com

12. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටි වසන්ත මුදලිගේ නිදහස් කරන ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා නියෝග කිරීම.**

2022 අගෝස්තු 18 වැනිදා අත්අඩංගුවට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දින 167ක කාලයක් රඳවාගෙන සිටි අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ නිදහස් කරන ලෙස කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා ජන 31 වැනිදා නියෝග කළේය. එම තීන්දුවෙහි සඳහන් වන්නේ, සැකකරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට ගැනෙන වැරදි කිසිවක් සිදු කර ඇතැයි, ඉදිරිපත්ව ඇති කිසිදු සාක්ෂියකින් අනාවරණය නොවන බවයි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට පත් කෙරුණු සැකකරුවකු මහේස්ත්‍රාත් අධිකරණයකින් නිදහස් කළ පළමු අවස්ථාව මෙය වන අතර, එය ඓතිහාසික තීන්දුවක් ලෙස අවධානයට ලක්ව තිබේ.

මූලාශ්‍ර: www.adaderana.lk

## වියුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් 3ක් මෙහි ඇතුළත් වේ.**

**3 වගුව: 2023 ජනවාරි: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 03**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 03 |
| **එකතුව** | **03** |

01. **අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ රඳවා තබාගැනීමට එරෙහිව ජාත්‍යන්තර සංවිධාන 7ක් ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීම.**

වසන්ත මුදලිගේ 2022 අගෝස්තු 18 වැනිදා සිට අත්අඩංගුවේ පසුවන අතර, එම "අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම" ශ්‍රී ලංකා රජය වහාම අවසන් කළ යුතු බව ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් (ජාත්‍යන්තර ක්ෂමා

සංවිධානය), මානව හිමිකම් සහ සංවර්ධනය සඳහා වූ ආසියානු සංසදය (FORUM-ASIA), CIVICUS, පෙරටුගාමී ආරක්ෂක සංවිධානය, හියුමන් රයිට්ස් වොච්, ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර ක්‍රියාකාරී කණ්ඩායම සහ සාමය සහ යුක්තිය සඳහා වූ ශ්‍රී ලංකා ව්‍යාපාරය යන සංවිධාන 7 ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරමින් සඳහන් කර ඇත.

ඔහු රඳවා තබා ඇත්තේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් අත්සන් කරන ලද නියෝගයක් මත බවත්, එය, අවලංගු කරන බවට ශ්‍රී ලංකා රජය දිගු කලක් තිස්සේ පොරොන්දු වූ කුරිරු නීතියක් බවත් අදාළ සංවිධාන අවධාරණය කර තිබේ.

මූලාශ්‍ර:1. www.ft.lk, 2. mawbima.lk

02. **ශ්‍රී ලංකා රජය මානව හිමිකම් උල්ලංඝනය කරන බවට මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය ප්‍රකාශ කිරීම.**

ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මානව හිමිකම් අයිතීන් හා නීති උල්ලංඝනය කරන බවටත්, අරගලය මර්දනය කරමින් ක්‍රමෝපායික ලෙස මර්දනය රට තුළ දියත් කර ඇති බවටත්, මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (FIDH) එහි නවතම වාර්තාවෙන් චෝදනා කරයි. රටවල් 116ක සංවිධාන 188ක් ඇතුළත් එම සංවිධානය වැඩිදුරටත් ප්‍රකාශ කරන්නේ හදිසි නීතිය යොදා හමුදාව යොදවා නැවත රටේ අරගල ඇති වීමට ඉඩ නොතබන බවට ජනාධිපතිවරයා කර ඇති ප්‍රකාශය ඉතා බරපතළ බවයි.

මූලාශ්‍රය: www.youtube.com

03. **'සමාජ මාධ්‍ය නියාමනය සහ ප්‍රකාශනයේ නිදහස' මැයෙන් විද්වත් සංවාදයක් පැවැත්වීම.**

සමාජ මාධ්‍ය නියාමනයට නව නීති ගෙන එන බවට ජනාධිපතිවරයා කළ ප්‍රකාශය පදනම් කර ගනිමින්, 'හෑෂ්ටැග් පරපුර' සංවිධානය කළ මෙම සංවාදය ජනවාරි 27 වැනිදා මාර්ගගතව පැවැත්විණි.

මහාචාර්ය රොහාන් සමරජීව (සභාපති, LIRNEasia) මන්දනා ඉස්මයිල් (කර්තෘ, The Sunday Morning) ජගත් වික්‍රමනායක (ජනාධිපති නීතිඥ) සම්පත්දායකයින් ලෙස සහභාගි වූ අතර සංවාදය මෙහෙයවන ලද්දේ, නීතිඥ නමෑා ගුණවර්ධන විසිනි.

මූලාශ්‍රය: hashtag generation

**4 වගුව: මාධ්‍ය නිදහස: 2023 ජනවාරි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| **ආවරණය කර ඇති සංරචකය** | **2023 ජනවාරි** |
|---|---|
| | නව සිදුවීම් |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | - |
| නීතිමය කොන්දේසි | 12 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | - |
| වෘත්තීයවේදීත්වය | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 03 |
| **එකතුව** | **15** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


## Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25


Layout: Nalinda Seneviratne